**23. ශීර්ෂය 21 - විගණකාධිපති දෙපාර්තමේන්තුව**

**23.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 63 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**23.2 අග්‍රිම ගිණුම**

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 08 කට අදාලව ලබාදී තිබුණු එකතුව රු.170,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම, කාර්යය නිම වී මාස 1½ සිට මාස 6 ක කාල පරාසයක් තුළදී නිරවුල් කර තිබුණි.

**23.3 ආදායම් ගිණුම්**

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් ආදායම් සංකේතයකට අදාලව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවරී තිබුණි. අංක 20.03.02.01 දරන එම ආදායම් සංකේතයට (විගණන ගාස්තු) අදාල සිදුකල නියැදි පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම අනුව 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු.189,732,373 ක් වූ හිඟ ආදායම 2014 දෙසැම්බර් 31 දිනට රු.214,793,613 ක් දක්වා රු.25,061,240 කින් හෙවත් සියයට 13.2 කින් වැඩිවී තිබුණි.

(ආ) මහනගර සභා 34 කට, නගර සභා 19 කට, ප්‍රාදේශීය සභා 142 කට, සංස්ථා මණ්ඩල හා රජයට පවරා ගත් ආයතන 135 කට අදාලව හිඟ විගණන ගාස්තු අයකර ගැනීමට සිහිකැඳවීම් ලිපි යවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එම ආයතනවලින් හිඟ විගණන ගාස්තු අයවීම ඉතා පහළ මට්ටමක පැවතුණි.

(ඇ) රජයේ දෙපාර්තමේන්තු යටතේ පවතින විශාල ආදායම් ලබන අරමුදල් වෙතින් විගණන ගාස්තු අය කර ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි.

(ඈ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල, රජයට පවරාගත් ආයතන වෙතින් විගණන ගාස්තු අය කර ගැනීම සඳහා අදාල අමාත්‍යාංශ වෙතින් එකඟතාවය ලැබීම බොහෝ ප්‍රමාද වූ අවස්ථා රාශියක් තිබීම නිසා විගණන ගාස්තු බිල්පත් නිකුත් කිරීමද බොහෝ ප්‍රමාද වී තිබුණි.

## 23.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 ඔක්තෝබර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,850,976 ක් විය.

(ආ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තුන්දෙනෙකුගෙන් එකතුව රු.29,875 ක් වූ ණය ශේෂ මුදල් රෙගුලාසි 485(4) හා 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ අංක 1.1.6 හා 1.1.7 දරන ඡේද ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය සේවයෙන් ස්ථිරව මුදා හරින ලද නිලධාරීන් හතර දෙනෙකුගේ එකතුව රු.157,110 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණි.

(ඈ) සේවය අතහැර ගිය නිලධාරීන් 12 දෙනෙකුගේ එකතුව රු.456,120 ක් වූ ණයශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 යන වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්‍රාමික නිලධාරීන් 13 දෙනෙකුට අදාලව එකතුව රු.1,406,523 ක් වූ ණය ශේෂ අයනොවී පැවතුණි.

(ඊ) මිය ගිය නිලධාරීන් 09 දෙනෙකුගේ එකතුව රු.203,052 ක් වූ ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

(උ) සේවය අවසන් කළ නිලධාරීන් 04 දෙනෙකුගේ එකතුව රු.598,296ක් වූ ණය ශේෂ අයනොවී පැවතුණි.

## 23.5 බේරුම් නොකළ බැරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව DGSA 8(i) ආකෘතිය යටතේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ 2014 දෙසැම්බර් 31 දිනට බැරකම් නිවැරදිව පෙන්විය යුතු වුවත්, එකතුව රු.960,614 ක් වූ බැරකම් ගිණුම් තුළ අනාවරණය කර නොතිබුණි.

**23.6 බැංකු සැසඳුම්**

-----------------

බැංකු ගිණුමෙහි නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක කල් ඉක්මවූ එකතුව රු.15,530 ක් වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**23.7 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 354 | 211 | 143 | - |
| (ii) | ද්විතියික මට්ටම | 1,214 | 798 | 416 | - |
| (iii) | තෘතියික මට්ටම | 178 | 141 | 32 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 181 | 137 | 44 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 7 | - | 7 |
| | **එකතුව** | **1,927** | **1,294** | **635** | **7** |